**කයිට්ස් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 15 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 අගෝස්තු 03 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කයිට්ස් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.1, 200,000 ක්වූ පුලියංකුලි ඉඩම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ නමුත් අයිතිය සභාවට පවරා ගැනීමේ කාර්යයන් අවසන් වී නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි. | ඉඩම් සභාවට පවරා ගැනීම සඳහා අයශා කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.79,124 ක් වටිනා ගනුදෙනු දෙකක් සඳහා අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් නොකිරීමෙන් එම ගනුදෙනු තහවුරු කළ නොහැකි විය. | අදාල තහවුරු කිරීම් ලිපිලේඛන ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරි අනාගතයේදි කටයුතු කරනු ලැබේ. |

(ඇ) නොසැසඳු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කයිට්ස් මාළු වෙළෙඳ පොලේ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු. 633,600ක් ලෙස දක්වන නමුත් අවසන් ගිණුම් අනුව රු.3,133,600ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා රු. 2,500,600ක වෙනස්කම් පැවැතුණි. | ගොඩනැගිල්ලේ වටිනාතම අවසන් ගිණුම්වල ඇතුළත් කළ යුතුවේ. | පිළිතුරු ලබා දි නොමැත. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම කිරීමට නොහැකි විය. |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරනු ලැබේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (viii) වගන්තිය | ආදායම් පරික්ෂකවරයා විසින් අනවසර ප්‍රචාරක දැන්වීම් 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | අනවසර ප්‍රචාරක දැන්වීම් 06 සම්බන්ධයෙන් කටයුතු කටයුතු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති III පරිච්ඡේදයේ 32 වගන්තිය | දේපළ තක්සේරු කිරීම සහ වරිපනම් හා බදු අය කිරීම සභාව විසින් සිදු කර නොතිබුණි. | අදාළ මූල්‍ය හා පරිපාලන රීති අනුව කටයුතු කළ යුතු වේ. | දේපළ තක්සේරු කිරීම් කටයුතු සභාව විසින් සිදු කෙරෙමින් පවතී. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවිය යුතු ඇප මුදල්රු.153,587ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් රෙගුලාසිවලට අනුකූලව නිරවුල් කළ යුතු වේ. | කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවිය යුතු ඇප මුදල් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | අංක 30/2016 දරන 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | සභාව සතු වාහන 04 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | අලුත්වැඩියා කළ වාහන සඳහා ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුවේ. | වාහන 04 අලුත්වැඩියා කර තිබූ නිසා ඒ සඳහා ඉන්ධන දහනය පරීක්ෂා කිරීමේ කටයුතු කරනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,565,468 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,191,680 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| කුලී | 2,921,300 | - | 2,233,867 | 8,000 | 3,625 | - | 2,677,922 | 6,266 |
| බලපත්‍ර ගාස්තු | 451,650 | - | 448,762 | - | 423,400 | - | 322,999 | - |
| වෙනත් ආදායම් | 44,502,876 | - | 37,565,500 | 74,450 | 43,778,938 | - | 9,112,957 | 6,418,520 |
| එකතුව | **47,875,826** | **-** | **40,248,129** | **55,450** | **47,827,897** | **-** | **12,113,878** | **6,424,786** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු. 12,113,878 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.40,248,129 කින් වැඩි වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.28,134,521කින් වැඩි වී තිබුණි. එසේ වුවත්, ආදායම් බිල් කිරීමට සභාව අපොහොසත් වි තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | කටයුතු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුහසාධනය සහ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවු කරණු පහත සඳහන් පරිදි විය.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සඳහන් සියළුම කාරණා ක්‍රියාත්මක කිරිමට ඵලදායි ක්‍රියාමාර්ග ගතයුතු වේ. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | සභාවේ සියළුම ක්‍රියාකාරකම් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ලැබේ. |

(ඇ) **කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරකම් 15ක් සඳහා පිරිවැය ඇස්තමේන්තු සිදුනොකර ක්‍රියාකාරකම් ආරම්භ කර තිබුණත් එකී ක්‍රියාකාරකම්වල කාර්යසාධනයේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | අදාල ක්‍රියාකාරකම් කඩිනමින් අවසන් කිරිමට කටයුතු කළ යුතුවේ. | අදාල කාර්යයන් සඳහා පිළිගත හැකි හේතු සඳහා කාලය දීර්ඝ කිරීම් ලබාදී ඇත. |

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ ඝන අපද්‍රව්‍ය ඉවත්කිරිම සඳහා රු.4,779,889 ක් වැය කර තිබුණත් ඝන අපද්‍රව්‍ය ඉවත්කිරිමේ කාර්යයන් ප්‍රාදේශීය සභාව විසින් ඵලදායි ආකාරයෙන් සිදු කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් අයුරින් සිදුකර වෙන්කර එකතු කිරීම තහවුරු කළ යුතු වේ. | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කරනු ලැබේ. |

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ii) | සන අපද්‍රව්‍ය රැස්කිරීමේදී ආවරණය කළ වාහන භාවිතා නොකර විවෘත වාහනවලින් කසළ රැස්කරන බැවින් මාර්ගවල ගමන් කරන ජනතාව අපහසුතාවයට ලක්වී තිබුණි.එසේම ප්‍රමාණයට අධිකව ප්‍රවාහනය කිරීම නිසා මාර්ගය පුරා කසල වැටී තිබුණි. | සන අපද්‍රව්‍ය රැස්කිරීමේදි ආවරණය කළ වාහන භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ සන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ආවරණය කළ වාහන නොමැත. |
| (iii) | සන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ යුතු වේ. | අනාගතයේදි වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ඉ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීමට කටයුතු කළ යුතු වේ. | මදුරුවන් බෝවීම වැලැක්වීම ඩෙංගු මර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේදී කරනු ලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු ගිණුම්වල ඇති රු.17,016,758 ක් ප්‍රදේශයේ සංවර්ධන අරමුණු සඳහා උපයෝජනය නොකර පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | සභාවේ අරමුදල් මහජනතාවගෙන් ලැබූ ඒවා බැවින් ඒම අරමුදල් ප්‍රදේශයේ සංවර්ධන අරමුණු උපයෝජනය කළ යුතු වේ. | ස්ථාවර තැන්පතු ගිණුම්වල රු.20,843,957.58 ක් පැවැති නමුත් ඉන් රු.172,800.88 ක් හැර අනෙකුත් සියල්ල 2015 වර්ෂයට පෙර ආරම්භ කර තිබුණි. |
| (ආ) | සභාව සතුව පවතින සුසාන භූමි 16ක් සඳහා සභාව විසින් සංවර්ධන ක්‍රියාමාර්ග සිදු කර තිබුණත්, සුසාන භූමි බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සුසාන භූමි 16ක් සඳහා සභාව විසින් සුසාන භූමි බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සුසාන භූමි සීමා නිර්ණය කිරීමෙන් පසුව බදු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වරිපනම් හා බදු තක්සේරු කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | දේපළ තක්සේරු කිරීමට කටයුතු කළ යුතුවේ. | දේපළ තක්සේරු කිරීමේ කටයුතු දැනට කෙරෙමින් පවති. |
| (ඇ) | පළාත් පාලන සහකාර විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රදේශයට අදාල මූලික කාර්යයන් ඉටු නොවී පැවැතුණි. | පළාත් පාලන සහකාර විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු ලබා දි නොතිබුණි. |
| (ඉ) | ප්‍රාදේශීය සභාව මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබු සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | සභාව විසින් ජනතාවට සැලසිය යුතු සේවාවන් ලැයිස්තුවේ සඳහන් අයුරින් මහජනතාවට සේවාවන් නියමිත කාලයේ සැලසිය යුතු වේ. | අවශ්‍යතා තොරතුරු සහ ලේඛන නියමිත අයුරින් ඉදිරිපත් නොකිරිමේදි පමණක් ප්‍රමාදයන් සිදු වේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 19 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබු බව නිරීක්ෂණය විය. | අනුමත තනතුරුවලට සමාන ප්‍රමාණයක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරන වාහන 06ක් වර්ෂ 0 2කට අධික කාලයක සිට අලුත්වැඩියා කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කළ හැකි වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | වාහන 04ක් වෙන්දේසි මගින් විකිණීමට කටයුතු කර ඇති අතර අනෙකුත් වාහන දෙකම ලියාපදිංචි කර නොමැති නිසා කිසිදු ක්‍රියාමාර්ගයක් ගත නොහැක. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) එකතුව රු.50,070,600 ක් වටිනා දේපළ 22ක් සභවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේපළ 22ක් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කෙරේ. |
| (ආ) සභාවට පරිත්‍යාග කර තිබූ වාහන 22ක අයිතිය සභවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පවරා ගැනීමට ඉදිරියේදි කටයුතු කෙරේ. |

### 3.4.3 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාවට අයත් දේවාරාදම් බෝට්ටුව වසර 04 ක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි. | බෝට්ටුව ලියාපදිංචි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර වෙන්දේසි මගින් විකිණීමටද වහාම කටයුතු කළ යුතුවේ. | අදාල බෝට්ටුව මෙතෙක් ලියාපදිංචි කර නොමැති අතර අවාල බෝට්ටුව ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) සභාවට අයත් නවීන වෙළෙඳ පොළ කඩකාමර සංකීර්ණයේ කඩකාමර 3ක් පසුගිය වර්ෂ 10ක් පුරා නිෂ්කාර්යව පැවතුණි. | නවීන වෙළෙඳ පොළ කඩකාමර සංකීර්ණයේ කඩකාමර ඵලදායි ආකාරයෙන් උපයෝජනය කළ යුතු වේ. | කඩකාමර සංකීර්ණයේ කඩකාමර කුලියට ලබාදීමට කටයුතු කර ඇත. |

### 3.4.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ප්‍රධාන කාර්යාලයේ වාර්ෂික ගබඩා සමීක්ෂණයේදි අයිතමයන් 27ක් සඳහා තථ්‍ය වටිනාකම නොදක්වා සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර තිබුණි. | වාර්ෂික ගබඩා සමීක්ෂණය විධිමත් අයුරින් සමීක්ෂණ වාර්තාව සකස් කළ යුතුවේ. | පරිත්‍යාග කළ භාණ්ඩවල වටිනාකම තීරණය කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) එලුවායි තිවු මහජන පුස්තකාලයේ වටිනාකම රු.46,198ක් වූ පොත් 442ක් අස්ථාන ගතවීම සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අස්ථාන ගතවූ පොත් සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග වහාම ගත යුතුවේ. | අස්ථාන ගතවූ පොත් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අයවැය ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් වන ගමන් වියදම්, මූලධන වත්කම් අලුත්වැඩියා, සභනාධාර හා උපකාරක මුදල්, විශ්‍රාම වැටුප් ආදියෙහි තථ්‍ය වියදම්වල වැඩි ප්‍රතිශතයක් ඉතිරිවීම් පැවැතිණි. මේ නිසා මෙම අයවැය ඇස්තමේන්තුව ඵලදායි නොවූ එකක් ලෙස සැලකුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |